දුරකථන
தொலைபேசி
Telephone
) 0112669192 , 0112675011
) 0112694033, 0112675280
) 0112675449

ෆැක්ස්
பெக்ஸ்
Fax
) 0112693866
) 0112693869
)0112692913

විද්‍යුත් තැපැල
மின்னஞ்சல் முகவரி
e-mail
)postmaster@health.gov.lk

වෙබ් අඩවිය
இணையத்தளம்
website
) www.health.gov.lk

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය
எனது இல
My No.
) MH/AD/01/09/Add.Se.(PHS)/202

ඔබේ අංකය
உமது இல
Your No.
)

දිනය
திகதி
Date
) 2026.07.

# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# சுகாதார மற்றும் வெகுஜன ஊடக அமைச்சு
# Ministry of Health & Mass Media

පොදු චක්‍රලේඛ ලිපි අංක : 01 - 55 / 2026

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන් - ජාතික රෝහල (කොළඹ, මහනුවර, ගාල්ල)
පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්, ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,
ශික්ෂණ රෝහල් අධ්‍යක්ෂවරුන්, විශේෂිත ව්‍යාපාර අධ්‍යක්ෂවරුන්,
රේඛීය අමාත්‍යාංශය යටතේ ඇති සියලුම රෝහල් හා ආයතන ප්‍රධානීන්.

**<u>අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) තනතුර</u>**
**<u>සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය</u>**

01. මෙම අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) තනතුරට අයදුම්පත් කැඳවීම සඳහා 2025.10.15 දිනැතිව නිකුත් කරන ලද අංක 02-163/2025 දරන පොදු චක්‍රලේඛය **2026.02.10** දිනැතිව අවලංගු කර ඇති අතර, 2014.10.11 දිනැති අංක 1883/17 දරන ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ සහ ඉන් පසු එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි පරිශිෂ්ඨය V හි සඳහන් ඉහත තනතුරට අදාළ සුදුසුකම් ලද **ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධරයන්ගෙන් සහ දන්ත ශල්‍ය වෛද්‍ය නිලධරයන්ගෙන්** නැවත අයදුම්පත් කැඳවනු ලැබේ.

**I.** මූලික සුදුසුකම්:

අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය වන විට සක්‍රීය සේවයේ නියුතු ශ්‍රී ලංකා වෛද්‍ය සේවයේ ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ හෝ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණියේ තනතුරු දරන වෛද්‍යවරයෙකු වීම හෝ එම ශ්‍රේණියේ තනතුරු දරන දන්ත ශල්‍ය වෛද්‍යවරයෙකු වීම.

02. සේවා නියමයන් හා කොන්දේසි:

මෙම තනතුර සඳහා පත් කරනු ලබන වෛද්‍ය නිලධාරීන් පෞද්ගලික වෛද්‍ය වෘත්තියෙහි යෙදීමට හිමිකම් නොලබනු ඇත.

03. වැටුප් ක්‍රමය:

(අ) මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 අනුව SL-03-2025 වැටුප් කාණ්ඩයේ පියවර 1 (රු. 156,000 - 12 X 4,850 - 214,200) අදාළ වේ.

(ආ) පශ්චාත් උපාධි සුදුසුකම් සහිත වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ නිලධාරීන්ට මසකට රු.6,000/- ක් බැගින් වූ වෛද්‍ය පරිපාලන දීමනාවක් ගෙවනු ලැබේ.

04. බඳවා ගැනීමේ ක්‍රමය:

(අ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ලකුණු පටිපාටියක් මත පදනම්ව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් තුළින් පවතින පුරප්පාඩු පුරවනු ලැබේ.

(ආ) සම්මුඛ පරීක්ෂණයේ දී යොදා ගැනීමට නියමිත ලකුණු පරිපාටිය **ඇමුණුම** I ලෙස අමුණා ඇත.

05. අයදුම් කිරීමේ ක්‍රමය:

(අ) මේ සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර **2026.07.24** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ආයතන ප්‍රධානීන් හෝ විමධ්‍යගත ඒකක/ විශේෂිත ව්‍යාපාර ප්‍රධානීන් මඟින් **ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, "සුවසිරිපාය", 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10** යන ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් පමණක්** එවිය යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහල කෙලවරෙහි ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

(ඇ) තම අයදුම්පත්‍රය ඉල්ලා අස් කර ගැනීමට කිසිවෙකු අදහස් කරන්නේ නම්, අයදුම්පත් භාර ගන්නා අවසාන දින සිට සති 1ක් ඇතුළත මා වෙත දන්වා එසේ කිරීමට ඔහුට/ඇයට හැකිය.

06. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.10.11 දිනැති අංක 1883/17 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද ශ්‍රී ලංකා සෞඛ්‍ය සේවයේ වෛද්‍ය සේවා ව්‍යවස්ථා සංග්‍රහයෙහි සහ එයට වරින් වර කරන ලද සංශෝධනයන්හි විධිවිධාන, රාජ්‍ය සේවයේ තනතුරුවලට බඳවා ගැනීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභා පරිපාටික රීතීන්හි I වැනි කාණ්ඩයේ ඇතුළත් කොන්දේසි සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ ඇතුළත් කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

07. මෙම නිවේදනයේ සිංහල, ඉංග්‍රීසි හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

08. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට මූලික සුදුසුකම් ඇගයීම සිදු කරන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් තේරී පත් වී වැඩ භාර ගන්නා දිනය, පත්වීම් දිනය ලෙස සලකනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

## අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය සේවා) තනතුර සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය

| | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 01 | **සේවා කාලය**<br><br>I. ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියේ සක්‍රිය සේවා කාලය සඳහා ලකුණු 20 (SL-1 I ශ්‍රේණිය)<br>(සක්‍රිය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 04 බැගින්)<br><br>II. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රේණිය සඳහා ලකුණු 20 (SL-3)<br>(සක්‍රිය සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 05 බැගින්)<br><br>සටහන:-<br><br>වසරකට අඩු සේවා කාලයක් සඳහා පහත පරිදි ලකුණු ලබා දිය යුතුය.<br><br>අ) මාස 09ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා - ඉහත ලකුණු වලින් ¾ ක්.<br>ආ) මාස 06ක් හෝ මාස 06කට වැඩි සහ මාස 09කට අඩු කාලයක් සඳහා - ඉහත ලකුණු වලින් ½ක්.<br>ඇ) මාස 03ක් හෝ මාස 03කට වැඩි සහ මාස 06කට අඩු කාලයක් සඳහා - ඉහත ලකුණු වලින් ¼ක්.<br>ඇ) මාස 03කට අඩු කාලයක් සඳහා - ලකුණු ප්‍රදානය නොකෙරේ. | ලකුණු 40 |
| 02 | **අධ්‍යාපන සුදුසුකම්**<br><br>I. වෛද්‍ය විශාරද උපාධිය (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) - මණ්ඩල සහතිකය සහිතව - ලකුණු 10<br><br>II. වෛද්‍ය විශාරද උපාධිය (වෛද්‍ය පරිපාලන/ ප්‍රජා වෛද්‍ය) - මණ්ඩල සහතිකය රහිතව - ලකුණු 05 | ලකුණු10 |
| 03 | **අතිරේක සුදුසුකම්** | |
| | I. සේවා පලපුරුද්ද (එක් අවුරුදු සක්‍රිය සේවා කාලයක් සඳහා ලකුණු 02 බැගින්)<br><br>සටහන :-<br>2014.10.11 දිනැති අංක 1883/17 දරන ශ්‍රී ලංකා වෛද්‍ය සේවා ව්‍යවස්ථාවේ IV පරිශිෂ්ඨය සහ කලින් කලට කරන ලද සංශෝධන පරිද්දෙන් මහජන සෞඛ්‍ය සේවා තනතුරුවල දරන ලද තනතුරු සඳහා සේවා පළපුරුද්ද වෙනුවෙන් ලකුණු ලබා දෙනු ලැබේ. (පත්කිරීම් බලධාරියා විසින් නිකුත් කරන ලද පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතුය.) | ලකුණු 10 |

| | | |
|---|---|---|
| | II. **තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ සිදුකරන ලද ව්‍යාපෘති** (එක් ව්‍යාපෘතියකට ලකුණු 03 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 15)<br><br>(අ) ඇමුණුම I (I) හි දක්වා ඇති නිර්ණායක මත පදනම්ව ව්‍යාපෘති ඇගයීම සිදු කෙරෙනු ඇත.<br><br>(ආ) අයදුම්පත සමඟ ව්‍යාපෘති ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයෙහි ලකුණු ප්‍රදානය කිරීමේදී ලැයිස්තුවේ දක්වා ඇති ව්‍යාපෘති පමණක් සලකා බලනු ලැබේ.<br><br>(ඇ) විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ප්‍රදානය කිරීමේදී, ඇමුණුම I (II) හි සඳහන් ලකුණු ලබා දීමේ පරිපාටිය යොදා ගනු ලැබේ.<br><br>සැ.යු. :-<br>අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට හෝ එයට පෙර ව්‍යාපෘති සම්පූර්ණ කර තිබිය යුතුය. | ලකුණු 15 |
| | III. **තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය යටතේ පළ කරන ලද පර්යේෂණ/ ප්‍රකාශන**<br><br>(අ) පර්යේෂණ/ ප්‍රකාශන ඇගයීමේ දී ඇමුණුම I (III) හි සඳහන් නිර්ණායක පදනම් කරගනු ලැබේ.<br><br>(ආ) අයදුම්පත සමඟ පර්යේශණ/ ප්‍රකාශන ලැයිස්තුවක් ඉදිරිපත් කළ යුතු අතර, සම්මුඛ පරීක්ෂණයෙහි ලකුණු ප්‍රදානය කිරීමේදී ලැයිස්තුවේ දක්වා ඇති පර්යේෂණ/ ප්‍රකාශන පමණක් සලකා බලනු ලැබේ.<br><br>(ඇ) පර්යේෂණ/ ප්‍රකාශන සඳහා ලකුණු ප්‍රදානය කිරීමේදී, ඇමුණුම I (IV) හි සඳහන් ලකුණු ලබා දීමේ පරිපාටිය යොදා ගනු ලැබේ.<br><br>සැ.යු. :- ජ්‍යෙෂ්ඨ වෛද්‍ය පරිපාලන ශ්‍රේණියට පත්වීම් ලද පසු සිදු කරනු ලැබූ පර්යේෂණ/ ප්‍රකාශන විය යුතු අතර, අයදුම්පත් භාර ගැනීමේ අවසන් දින හෝ ඊට පෙර සම්පූර්ණ කරන ලද පර්යේෂණ/ ප්‍රකාශන විය යුතුය. | ලකුණු 15 |
| **04** | **සම්මුඛ පරීක්ෂණයෙහි කාර්යසාධනය**<br>(අ) සන්නිවේදන කුසලතා - ලකුණු 02<br>(ආ) පෞරුෂත්වය - ලකුණු 02<br>(ඇ) වෘත්තීයමය ආචාරශීලීබව - ලකුණු 02<br>(ඈ) නායකත්වය - ලකුණු 02<br>(ඉ) තීරණ ගැනීමේ සහ විශ්ලේෂණාත්මක කුසලතා - ලකුණු 02 | ලකුණු 10 |
| | **මුළු ලකුණු** | **100** |

ඇමුණුම 1 (I)

<u>විශේෂ ව්‍යාපෘති ඇගයීම සඳහා යොදා ගත යුතු නිර්ණායක</u>

I. ව්‍යාපෘතිය අයදුම්කරු විසින් අයදුම්කර ඇති තනතුරට අයත් රාජකාරී කටයුතු යටතට ගැනෙන විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ව්‍යාපෘතියක් විය යුතුය.

II. ව්‍යාපෘති වාර්තාව මඟින් ව්‍යාපෘතියේ අරමුණු, පූර්වාපේක්ෂිත ප්‍රතිඵල, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ස්ථානය, මූල්‍ය වටිනාකම, ව්‍යාපෘතියේ කාල රාමුව සහ මූල්‍ය ප්‍රභවය පැහැදිලිව ඉදිරිපත් කර තිබිය යුතුය.

III. ආයතනික හෝ ප්‍රජා සෞඛ්‍ය සම්බන්ධ ගැටළු/ ප්‍රශ්න සඳහා ව්‍යාපෘතිය මඟින් නිර්මාණාත්මක සහ නවෝත්පාදක උපාය මාර්ග/ විසඳුම් හඳුන්වා දිය යුතු අතර ව්‍යාපෘතිය මඟින් නිලධරයාගේ සාමාන්‍ය රාජකාරී කටයුතුවලින් ඔබ්බට ගිය මැදිහත්වීමක් සිදුවී තිබිය යුතුය.

IV. ව්‍යාපෘතිය මඟින් අපේක්ෂිත ප්‍රතිඵල අත්පත් කර ගත් බවට අදාළ සුදුසු නිපුණතාවය සහිත ආයතනයකින් හෝ අධීක්ෂණ නිලධාරියකු විසින් සහතික කරන ලද බවට සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

V. ක්‍රියාත්මක තත්ත්වයේ පවතින ව්‍යාපෘතියක් අයදුම්කරු විසින් භාරගෙන තවදුරටත් ඉටු කරගෙන යාමක් මේ යටතේ ලකුණු ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

VI. නිලධරයාගේ රාජකාරී කටයුතුවල කොටසක් වශයෙන් නිලධරයා ව්‍යාපෘතියේ අධ්‍යක්ෂ/ ක්‍රියාත්මක බලධරයා/ සම්බන්ධීකාරක වශයෙන් කටයුතු කරනු ලබන, ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමක් ලෙස හෝ වැඩසටහන් සංවර්ධනය කිරීමක් වශයෙන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ ආයතනය මඟින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියක් ලකුණු ලබා දීම සඳහා සුදුසුකමක් නොවේ.

VII. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

VIII. අයදුම්කරු විසින් අයදුම් පත්‍රය සමඟ තමන් <u>ලකුණු ලබා ගැනීමට අපේක්ෂා කරන ව්‍යාපෘති</u> පිළිබඳ ලැයිස්තුවක් (<u>**උපරිම ව්‍යාපෘති 08 ක්**</u>) අමුණා ඉදිරිපත් කළ යුතුය.

**ඇමුණුම I (II)**

<u>විශේෂ ව්‍යාපෘති සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය</u>

I. අයදුම්කරුවන් තමා විසින් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති අතුරින් තමා අයදුම්කරන තනතුරෙහි විෂය ක්ෂේත්‍රයට වඩාත් ගැලපෙන **<u>උපරිම ව්‍යාපෘති 08 ක්</u>** සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

II. ඇමුණුම 1 හි සඳහන් නිර්ණායකවලට අනුකූලව, එක් ව්‍යාපෘතියකට ලකුණු 03 බැගින් ව්‍යාපෘති 05 ක් සඳහා උපරිම ලකුණු 15 ක් (3*5 =15) ලබා දෙනු ලැබේ.

III. අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති මගින් අත්පත් කර ගන්නා ලද ප්‍රතිඵල පිළිබඳව ලකුණු ලබා දීමේ දී වඩාත් සැලකිලිමත් වනු ඇත.

ඇමුණුම I (III)

<u>පර්යේෂණ/ ප්‍රකාශන ඇගයීම සඳහා අදාළ කර ගත යුතු නිර්ණායක</u>

I. පර්යේෂණ/ප්‍රකාශන:

(අ) ජර්නල් පත්‍රිකා - සමාලෝචනයට ලක් කර අංකිත ප්‍රකාශන මාලාවක පළකරන ලද ශාස්ත්‍රීය වැදගත්කමක් සහිත සම්පූර්ණ පිටපතක් සහිත රචනයක් හෝ ලිපියක්

(ආ) සමුළු පත්‍රිකා/ උද්ධෘත/ අවසන් වශයෙන් පිටපත් කරන ලද රචනා

ශාස්ත්‍රීය වටිනාකමක් සහිත සම්මේලන, සභාවක්, සම්මන්ත්‍රණ, අධ්‍යන සම්මෙලන, සංවාද මණ්ඩප, වැඩමුළු හෝ ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සඳහා යොදා ගත් වාර්තා

**"සැ.යු. - ඉහත අවස්ථාවන් සඳහා එම පර්යේෂණ/ප්‍රකාශන ඉදිරිපත් කර ඇති බවට තහවුරු කිරීම අයදුම්කරුගේ වගකීම වේ."**

II. කර්තෘන් කිහිපදෙනෙකුගේ සහභාගීත්වයෙන් පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සම්බන්ධයෙන් අයදුම්කරුගේ දායකත්ව ප්‍රමාණය පැහැදිලිව දක්වා තිබිය යුතු අතර, එම දායකත්ව ප්‍රමාණයට සමානුපාතිකව අයදුම්කරුට ලකුණු ලබා දෙනු ලැබේ.

III. එකම දත්ත/ පර්යේෂණ තොරතුරු මත පදනම්ව පළකරනු ලබන, බොහෝදුරට සමාන නිගමනයන්ට එළැඹී ඇති පර්යේෂණ/ප්‍රකාශන වෙන් වෙන් පර්යේෂණ/ප්‍රකාශන වශයෙන් සලකා බලනු නොලැබේ. එවැනි අවස්ථාවකදී ලකුණු ලබා දීම සඳහා එක් පර්යේෂණයක්/ප්‍රකාශනයක් පමණක් සලකා බලනු ලැබේ.

IV. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙනු ලැබූ පශ්චාත් උපාධි සුදුසුකමෙහි/ පශ්චාත් උපාධි පුහුණුවේ කොටසක් ලෙස පළකරන ලද පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

ඇමුණුම I (IV)

<u>පර්යේෂණ/ප්‍රකාශන සඳහා ලකුණු ලබා දීමේ පරිපාටිය - උපරිම ලකුණු - 15</u>

**01.** ලිපි සහ ජර්නල් පත්‍රිකා – ජාත්‍යන්තර/ජාතික මට්ටම/පිළිගත් උප ජාතික

1-3 – කතෘ ලැයිස්තුව – ලකුණු 03

>3 - ලකුණු 1.5

**02.** උද්ධෘත

1-3 – ලකුණු 02

>3 – ලකුණු 1

**03.** පෝස්ටර් ඉදිරිපත් කිරීම

1-3 – ලකුණු 01

>3 – ලකුණු 0.5

**04.** වාචික ඉදිරිපත් කිරීම - ලකුණු 0.5